සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජූලි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2023-08-26
පෙරවරු
[09.00 – 12.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

    (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

    (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

    (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

    (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

    (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

    (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

    (7) *ලකුණු 100 යි.*

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) සිදුවීම් යනු ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ නිමැවුම වේ.

(2) අදාළ බව යනු මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයකි.

(3) ආදායම යනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූලිකාංගයකි.

(4) කළමනාකරණ ගිණුම්කරණය, ඓතිහාසික මූල්‍ය තොරතුරු පමණක් සපයනු ලබයි.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, අස්තිත්වයක ලාභ / (අලාභ) ගණනය කිරීමට අදාළ නිවැරදි සමීකරණය තෝරන්න:

(1) ලාභය / (අලාභය) = ආරම්භක ශුද්ධ වත්කම් - අවසාන ශුද්ධ වත්කම්.

(2) ලාභය / (අලාභය) = අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැනිලි.

(3) ලාභය / (අලාභය) = අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් - ගැනිලි + අමතර ප්‍රාග්ධනය.

(4) ලාභය / (අලාභය) = ආරම්භක ශුද්ධ වත්කම් - අවසාන ශුද්ධ වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැනිලි.

**1.3** මුදලින් ලැබීම හෝ නොලැබීම නොසලකා, කිසියම් ගිණුම් කාලපරිච්ඡේදයකට අදාලව ආදායම / අයභාරය හඳුනාගනු ලැබේ. මීට අදාල ගිණුම්කරණ සංකල්පය වනුයේ:

(1) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි. (2) ගැලපුම් සංකල්පයයි.

(3) උපචිත සංකල්පයයි. (4) අස්තිත්ව සංකල්පයයි.

**1.4** 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කේවලස්වාමි ව්‍යාපාරයක් වන **රාම් ට්‍රේඩර්ස්** හි පොත්වලින්, පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

| | **රු.** |
|---|---|
| 2023 මාර්තු 31 දිනට මුළු වත්කම් | 8,400,000 |
| 2022 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 2,000,000 |
| වර්ෂය තුළදී යෙදවූ අමතර ප්‍රාග්ධනය | 1,000,000 |
| වර්ෂය තුළ සිදුකළ ගැනිලි | 500,000 |
| වර්ෂය සඳහා ලාභය | 2,400,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2023 මාර්තු 31 දිනට ස්කන්ධය (ප්‍රාග්ධනය) වනුයේ:

(1) රු.3,000,000/-. (2) රු.3,500,000/-. (3) රු.4,400,000/-. (4) රු.4,900,000/-.

**1.5** අයිතිකරු විසින් මුදලින් කළ ගැනිලි හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම පහත සඳහන් ඒවා අතුරින් තෝරන්න:

(1) වත්කම් වැඩිවීම සහ වගකීම් අඩුවීම. (2) වත්කම් අඩුවීම සහ ස්කන්ධය අඩුවීම.

(3) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම. (4) වත්කම් අඩුවීම සහ ස්කන්ධය වැඩිවීම.

**1.6** ගිණුම්කරණයට පාරිසරික සාධක ගණනාවක් බලපානු ලබන අතර, ඒවා PESTEL විශ්ලේෂණය භාවිතයෙන් විශ්ලේෂණය කළ හැකිය. පහත සඳහන් ඒවා අතුරෙන්, PESTEL විශ්ලේෂණයේ පාරිසරික (E) සාධක යටතේ වර්ගීකරණය කළ හැක්කේ කුමක් ද?

(1) නව රජයේ ප්‍රතිපත්තිවලට සමගාමීව හඳුන්වාදෙනු ලැබූ ආනයන සීමාකිරීම්.

(2) දේශීය ආදායම් පනතට මෑතකදී සිදුකළ සංශෝධන.

(3) දත්ත විශ්ලේෂණය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය හඳුන්වා දීම.

(4) කර්මාන්තයේ නියැලෙන විශේෂඥයින් හඳුන්වා දුන් කාබන් මුද්‍රාහැරීමේ මට්ටම (carbon footprint level).

**1.7** පහත සඳහන් ලෙජර් ගිණුම් අතුරෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කමක් ලෙස වර්ගීකරණය කළ හැක්කේ කුමක් ද?

(1) වෙළෙඳ ලැබිය යුතු මුදල්. (2) කාර්යාල කටයුතු සඳහා භාවිත කරන පරිගණක.

(3) ඉදිරියට කළ ගෙවීම්. (4) අවසාන තොගය.

**1.8** 2021 අප්‍රේල් 01 දින, **තරු ට්‍රේඩර්ස්** විසින් රු.6,000,000/- කට යන්ත්‍රයක් අත්පත් කරගන්නා ලදි. ව්‍යාපාරයේ යන්ත්‍ර ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වනුයේ හීනවන ශේෂ ක්‍රමය භාවිතයෙන් වාර්ෂිකව 20% බැගින් ක්ෂය කිරීමයි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂයවීම් වනුයේ:

(1) රු.768,000/-. (2) රු.960,000/-. (3) රු.1,200,000/-. (4) රු.1,688,000/-.

**1.9** ණය පදනමට මිලදී ගත් භාණ්ඩ සැපයුම්කරු වෙත ආපසු එවීම සඳහා ගැනුම්කරු විසින් භාවිත කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල තෝරන්න:

(1) හරපත. (2) බැරපත. (3) ගැණුම් ඇණවුම. (4) ජර්නල් වවුචරය.

**1.10** **දනිඳු** විසින් රු.1,500,000/- ක් වටිනා ලොරි රථයක් අමතර ප්‍රාග්ධනය වශයෙන් ව්‍යාපාරයට යොදවන ලදි. මෙම ගනුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම පහත සඳහන් ඒවා අතුරෙන්, තෝරන්න:

| | වත්කම් (රු.) | = | ප්‍රාග්ධනය (ස්කන්ධය) (රු.) | + වගකීම් (රු.) |
|---|---|---|---|---|
| (1) | +1,500,000 | = | - | +1,500,000 |
| (2) | -1,500,000 | = | - | -1,500,000 |
| (3) | -1,500,000 | = | -1,500,000 | - |
| (4) | +1,500,000 | = | +1,500,000 | - |

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** අස්තිත්වයයක් ව්‍යාපාරයේ භාවිතය සඳහා ඉඩමක් අත්පිට මුදලට මිලදී ගත්තේ නම්, එම අස්තිත්වයේ වත්කම්වල වෙනසක් සිදුනොවේ.

**1.12** දේපළ, පිරියත සහ උපකරණ ණයට මිලදී ගැනීම වාර්තා කිරීමට භාවිත කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ ගැනුම් ඉන්වොයිසියයි.

**1.13** බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම මගින් වංචා, වැරදි සහ අක්‍රමිකතා හඳුනා ගැනීමට සහ අවම කිරීමට උපකාරී වේ.

**1.14** ආදායම යනු අස්තිත්වයක අයිතිකරුවන් විසින් කරනු ලබන දායකත්වයකින් තොරව වත්කම්වල වැඩිවීමක් හෝ වගකීම්වල අඩුවීමක ප්‍රතිඵලයක් ලෙස ස්කන්ධය වැඩිවීමයි.

**1.15** අඛණ්ඩ පැවැත්ම සංකල්පයට අනුව, අස්තිත්වයේ මෙහෙයුම් සීමිත කාලයකට පමණක් පවතින බවට උපකල්පනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** මූල්‍ය ගිණුම්කරණයේ අරමුණු දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** "මුදල් වට්ටම්" සහ "වෙළෙඳ වට්ටම්" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** "යථාරූපී බවේ" [Substance over Form (ආකෘතියට වඩා හරය හුවා දැක්වීම)] සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.19** වෘත්තිය ආචාරධර්ම මූලධර්ම යටතට ගැනෙන "වෘත්තිය නිපුණත්වය" (Professional Competence) යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.20** පරිගණකගත ගිණුම්කරණ පද්ධතීන් සඳහා යොමුවීමට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

**අක්මාල් ට්‍රේඩර්ස්,** යනු **අක්මාල්** සතු සිල්ලර ව්‍යාපාරයකි. 2023 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම සමාන නොවීය. මෙම වෙනස, අවිනිශ්චිත ගිණුමට මාරු කර කෙටුම්පත් ගිණුම් පිළියෙල කරන ලදී. කෙටුම්පත් ගිණුම් අනුව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.1,875,000/- ක් ලෙස වාර්තාකර තිබුණි. **අක්මාල් ට්‍රේඩර්ස්** වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යනු ලැබේ.

පහත සඳහන් වැරදි සහ මග හැරීම් පසුව හඳුනාගන්නා ලදි:

(1) 2023 මාර්තු මාසයට අදාල විදුලි වියදම වන රු.35,000/-, විදුලි වියදම් ගිණුමට රු.53,000/- ක් ලෙස හරකොට ඇත. කෙසේවුවද, මීට අදාල බැර සටහන නිවැරදිව සටහන්කොට ඇත.

(2) 2023 මාර්තු මාසයට අදාල රු.135,000/- ක් වන කුලී වෙන්කිරීමේ ද්විත්ව සටහන, අදාල ගිණුම් පොත්වල දෙවරක් සටහන් කර ඇත.

(3) දෛනික විකුණුම් පොතෙහි එකතුව රු.180,000/- ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(4) බැංකුව විසින් අයකරන ලද රු.2,500/- ක් වූ බැංකු අයිරා පොලිය, පොලී ආදායම් ගිණුමට බැරකොට ඇත. කෙසේවුවද, මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත.

(5) 2023 ජනවාරි 01 දින, රු.150,000/- කට මිලට ගත් පරිගණකයක්, අළුත්වැඩියා සහ නඩත්තු ගිණුමට හර කොට ඇත. කෙසේවුවද, මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත. පරිගණක, ඒවායේ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් වැරදි, නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(b) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **අක්මාල් ට්‍රේඩර්ස්** හි ගලපන ලද / නිවැරදි කරන ලද ශුද්ධ ලාභය **ගණනය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**ශක්ති කොන්ක්‍රීට් වර්ක්ස්** යනු කොන්ක්‍රීට් නිෂ්පාදිත නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ශක්ති කොන්ක්‍රීට් වර්ක්ස්** හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---|
| 2022 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය | 650,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 4,250,000 |
| 2022 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කරන ලද) | 150,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ වියදම් | 25,000 |
| සෘජු වැටුප් | 1,200,000 |
| කර්මාන්ත ශාලා කළමනාකරුගේ වැටුප | 625,000 |
| කුලිය | 300,000 |
| ජලය | 50,000 |
| විදුලිය | 820,000 |
| යන්ත්‍ර නඩත්තු | 105,000 |
| පිරියත සහ යන්ත්‍ර මත ක්ෂය | 120,000 |
| මෝටර් ලොරි රථය මත ක්ෂය | 220,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

| විස්තරය | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට) | 585,000 |
| නොනිමි වැඩ (ප්‍රථමික පිරිවැයට අගය කර ඇත) | 235,000 |

(2) ව්‍යාපාරය විසින් එහි නිෂ්පාදිත පාරිභෝගිකයන් වෙත බෙදාහැරීම සඳහා ලොරි රථය භාවිත කරනු ලබන අතර, සියලුම පිරියත සහ යන්ත්‍ර කොන්ක්‍රීට් නිෂ්පාදිත, නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබයි.

(3) පහත වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන්කරනු ලැබේ:

| වියදම් | කර්මාන්තශාලාව | කාර්යාලය |
|---|---|---|
| විදුලිය | 75% | 25% |
| ජලය | 90% | 10% |
| කුලිය | 80% | 20% |

(4) නිෂ්පාදනය කරන ලද කොන්ක්‍රීට් නිෂ්පාදිත, නිෂ්පාදන පිරිවැය මත 18% ක ලාභ ආන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **ශක්ති කොන්ක්‍රීට් වර්ක්ස්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**ලසන්ත ට්‍රේඩර්ස්** යනු 2022 අප්‍රේල් 01 දින මුදලින් රු.2,800,000/- ක් ආයෝජනය කරමින් **ලසන්ත** විසින් ආරම්භ කළ තේවලස්වාමි ව්‍යාපාරයකි.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමෙහි (මුදල් පොත) සාරාංශය පහත පරිදි විය:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| **ලැබීම්** | **හර (රු.)** | **ගෙවීම්** | **බැර (රු.)** |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 2,800,000 | අත්පිට මුදලට ගැනුම් | 800,000 |
| අත්පිට මුදලට විකුණුම් | 4,200,000 | වෙළෙඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 3,800,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,800,000 | විදුලිය | 185,000 |
| | | සුළු මුදල් පොතට මාරු කිරීම | 120,000 |
| | | කාර්යාල උපකරණ මිලදී ගැනීම<br>(2023 ජනවාරි 01 දින මිලට ගන්නා ලදී) | 500,000 |
| | | වැටුප් සහ වේතන | 1,800,000 |
| | | ශේෂය ප/ගෙ | 1,595,000 |
| | **8,800,000** | | **8,800,000** |
| ශේෂය ඉ/ගෙ | 1,595,000 | | |

(2) 2023 මාර්තු 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් පහත පරිදි විය:

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1,450,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 1,200,000 |
| ගෙවිය යුතු විදුලි බිල්පත් | 19,000 |

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ කාර්යාල උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය සඳහා ප්‍රතිපාදන සිදු කිරීමයි.

(4) වර්ෂය තුළදී සිදුවූ සුළු මුදල් සම්බන්ධ ගනුදෙනු පහත සඳහන් පරිදි වේ:

(i) ගමන් වියදම් : රු.50,000/-.

(ii) සේවක සුභසාධන : රු.25,000/-.

(iii) ලිපිද්‍රව්‍ය : රු.35,000/-.

(5) 2023 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනට, **ලසන්ත ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) 2023 මාර්තු 31 දිනට, **ඉෂාකර් ට්‍රේඩර්ස්** හි බැංකු ප්‍රකාශනයේ රු.427,400/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, එදිනට එහි මුදල් පාලන ගිණුමේ රු.336,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්විය.

ව්‍යාපාරයේ සහකාර ගණකාධිකාරිවරයා විසින් බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පොතේ ශේෂය අතර වෙනසට පහත සඳහන් හේතු හඳුනාගන්නා ලදී:

(1) බැංකුවෙන් ලබාගත් ණය මුදලට අදාලව, බැංකුව විසින් රු.25,000/- ක ණය වාරිකය අඩුකොට ඇති අතර, මෙය මුදල් පොතේ සටහන් කොට නොමැත.

(2) සෘජු බැංකු තහවුරුවක් නිකුත් කිරීම සඳහා බැංකුව අයකළ රු.1,500/- ක බැංකු ගාස්තුව, මුදල් පොතේ සටහන් කොට නොමැත.

(3) පෙබරවාරි මාසය සඳහා වන රු.12,100/- ක බැංකු අයිරා පොලිය, බැංකුව විසින් 2023 මාර්තු මාසයේදී අයකොට ඇති අතර, එය මුදල් පොතේ සටහන්කොට නොමැත.

(4) ස්ථාවර තැන්පතුව සඳහා වන රු.25,000/- ක ලැබූ පොලිය, බැංකු ප්‍රකාශනයේ බැර කොට ඇති නමුත්, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත.

(5) රු.120,000/- ක චෙක්පතක් බැංකුවට තැන්පත් කර ඇති නමුත් 2023 මාර්තු 31 දින වන විට එය උපලබ්ධි වී නොමැත.

(6) 2023 මාර්තු 30 දින නිකුත් කරන ලද රු.225,000/- ක චෙක්පතක්, 2023 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ගළපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2023 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(B) කේවලස්වාමි ව්‍යාපාරයක් වූ **හසරංග ට්‍රේඩර්ස්** හි පහත දැක්වෙන ගනුදෙනු පහ (5) මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම ඔබ වෙත දී ඇත:

| | **වත්කම්** | | | | | | | = | **ස්කන්ධය (ප්‍රාග්ධනය)** | + | **වගකීම්** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **මෝටර් ලොරි රථය** | + | **තොගය** | + | **වෙළෙඳ ණයගැතියෝ** | + | **මුදල්** | | | | **වෙළෙඳ ණයහිමියෝ** |
| (1) | + 750,000 | | | | | | + 1,250,000 | = | + 2,000,000 | | |
| (2) | | | + 950,000 | | | | | = | | | + 950,000 |
| (3) | | | (60,000) | | + 90,000 | | | = | + 30,000 | | |
| (4) | | | | | | | (150,000) | = | (150,000) | | |
| (5) | | | | | | | (200,000) | = | | | (200,000) |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගිණුම්කරණ සමීකරණයේ (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගනුදෙනුව **හඳුනා දක්වන්න.**

(ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

**<u>C කොටස</u>**

(මුළු ලකුණු 20)

## **06** වන ප්‍රශ්නය

**ඉමන්දි බියුටි සෙන්ටර්, ඉමන්දිට** අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයකි. 2023 මාර්තු 31 දිනට **ඉමන්දි බියුටි සෙන්ටර්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**ඉමන්දි බියුටි සෙන්ටර්**

**2023 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| **විස්තරය** | **හර** | **බැර** |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| රූපලාවන්‍ය උපකරණ | 3,500 | |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 5,200 | |
| 2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| රූපලාවන්‍ය උපකරණ | | 625 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | | 400 |
| විකුණුම් | | 74,100 |
| ගැනුම් | 52,000 | |
| 2022 අප්‍රේල් 01 දිනට තොගය | 1,750 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 3,500 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,050 |
| අතැති මුදල් | 75 | |
| බැංකු ණය මුදල | | 560 |
| ආරක්ෂක වියදම් | 350 | |
| විදුලිය | 1,650 | |
| වැටුප් සහ වේතන | 7,000 | |
| බැංකු ණය පොලිය | 200 | |
| ගෙවූ කාර්යාල කුලිය | 2,600 | |
| ප්‍රවාහන වියදම් | 300 | |
| ජලය | 150 | |
| 2022 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 1,540 |
| **එකතුව** | **78,275** | **78,275** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට අවසාන තොගය රු.6,750,000/- ක පිරිවැයකට අගය කරන ලදී.

(2) 2023 මාර්තු 31 දින, **ඉමන්දිගේ** මිතුරියක් විසින් රු.500,000/- ක ගෘහ භාණ්ඩ **ඉමන්දිගේ ව්‍යාපාරය** වෙත සැපයූ අතර, මෙම මුදල 2023 අප්‍රේල් මාසයේදී පියවීමට **ඉමන්දි** එකඟ වී ඇත. මෙම ගනුදෙනුව ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| රූපලාවන්‍ය උපකරණ | : | වර්ෂයකට 25% බැගින් |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | : | වර්ෂයකට 20% බැගින් |

(4) 2022 අප්‍රේල් 01 දින, **ඉමන්දි** විසින් නව කුලී ගිවිසුමකට ඇතුළත් වන ලදී. මෙම ගිවිසුම පරිදි මාසික කුලිය රු.200,000/- කි. 2023 අප්‍රේල් මාසය සඳහා වන කුලිය ද මාර්තු මාසයේදී ගෙවා ඇත.

(5) විවෘත වෙළෙඳපොළේ පවතින රූපලාවණ්‍ය නිෂ්පාදිත සඳහා වන ඉහකම නිසා **ඉමන්දි** තායිලන්තයේ සිදුකළ පෞද්ගලික සංචාරයක් අතරතුරදී අයිතමයන් සමහරක් තම ණයපත (credit card) භාවිතකොට 2023 මාර්තු 20 දින මිලට ගන්නා ලදී. තායිලන්තයේදී මිලට ගත් මෙම අයිතමවල පිරිවැය රු.900,000/- ක් වූ අතර, මෙම මුදල ව්‍යාපාරයට යෙදවූ අමතර ප්‍රාග්ධනය ලෙස එකතු කිරීමට **ඉමන්දි** එකඟ විය. කෙසේවුවද, මෙම සම්පූර්ණ ගනුදෙනුව, **ඉමන්දිගේ ව්‍යාපාරයේ** ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. තවද, මෙම තොගය 2023 මාර්තු මාසය තුළදී විකුණා අවසන් කොට ඇති අතර, විකුණුම්වලට අදාල ගනුදෙනුව, ගිණුම් පොත්වල නිවැරදිව සටහන් කර ඇත.

(6) **ඉමන්දි** විසින් **සීමාසහිත ABC සමාගමෙන්** අයවිය යුතුව තිබූ රු.155,000/- ක මුදල, බොල් ණයක් ලෙස පොත්වලින් කපා හැරීමට තීරණය කරන ලදී.

(7) 2023 මාර්තු මාසය සඳහා වන රු.78,000/- ක විදුලි බිල, 2023 මාර්තු 31 දින වනවිටත් ගෙවා නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |